# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 42 දරන සිහළ සරණ පිං කැටය භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 අගෝස්තු මස 06 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 අගෝස්තු මස 07 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# 2009 අංක 42 දරන සිහළ සරණ පිං කැටය භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 අගෝස්තු මස 06 වන දින]

එල්.ඩී.—ඕ. අයිඑන්සී. 24/2007.

## සිහළ සරණ පිං කැටය භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"සිහළ සරණ පිං කැටය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන භාරයක්, එකී භාරයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. පී. තිලකරත්න විසින් ලියා සහතික කල අංක 765 සහ 2004 ජුනි මස 8 වන දින දරන භාර ඔප්පුව මගින් මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී භාරය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී භාරය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් ද, එකී භාරකාර මණ්ඩලය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2009 අංක 42 දරන සිහළ සරණ පිං කැටය භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) "සිහළ සරණ පිං කැටය භාරකාර මණ්ඩලයේ" දැනට සාමාජිකයන් වී සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සිහළ සරණ පිං කැටය භාරකාර මණ්ඩලය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් හා එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය සහ අධිකාරය සංස්ථාවට ඇත්තේ ය. සිහළ සරණ පිං කැටය භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ත්‍රස්තවාදී ක්‍රියා, ජනවාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා, ජාතිකත්වය පදනම් කරගෙන වෙනස් ලෙස සැලකීම හෝ පීඩාවකට භාජනය කිරීම ආදියට ගොදුරු වන බෞද්ධ තැනැත්තන්ට සහන සැලසීම ;

(ආ) ශ්‍රී ලංකාවේ බෞද්ධ තැනැත්තන්ගේ සදාචාරාත්මක, සංස්කෘතිකමය, ආර්ථික සහ සමාජ සුබසාධනය ඉහළ නැංවීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතික උරුමය සහ බෞද්ධයන්ට පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථාන සංරක්ෂණය කිරීම ;

(ඈ) සිංහල භාෂාව, සංස්කෘතිය සහ ඉතිහාසය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඊට පහසුකම් සැපයීම ;

(ඉ) බුදු දහම පිළිබඳ ඇති උනන්දුව ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) ථෙරවාදී බෞද්ධ ධර්මය සහ බෞද්ධ ජීවන දර්ශනය පෝෂණය කිරීම ;

(උ) බුදු දහම අධ්‍යයනය කිරීම සඳහා පහසුකම් සැපයීම ;

(ඌ) බුදු දහම ප්‍රායෝගිකව යොදා ගැනීම ධෛර්යමත් කිරීම ;

(එ) ජාතික සහ ජාත්‍යන්තර යන දෙයාකාරයෙන් ම බෞද්ධයන් සහ බෞද්ධ සංවිධාන අතර එකමුතුකම සහ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම ;

(ඒ) බෞද්ධ තැනැත්තන්ට සුභසාධන පහසුකම් සැපයීම ;

(ඔ) අවශ්‍යතාව ඇති බෞද්ධ තැනැත්තන්ට අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු පහසුකම් සැපයීම ;

(ඕ) කෘෂිකාර්මික, කාර්මික හෝ වාණිජමය ව්‍යාපාර ආරම්භ කර පවත්වාගෙන යාමට බෞද්ධ තැනැත්තන්ට ආධාර දීම සහ සහාය වීම ;

(ක) සංස්ථාවේ පරමාර්ථයන්ට සමාන පරමාර්ථ ඇති වෙනත් බෞද්ධ සංගම්, සමිති සහ සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව—

(අ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම ;

(ආ) ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ රැස් කිරීම ;

(ඇ) ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීම සහ එකතු කිරීම ;

(ඈ) සංස්ථාවට වහාම අවශ්‍ය නොවන අරමුදල් ආයෝජනය කිරීම ;

(ඉ) නිළධරයන් සහ සේවකයන් සේවයේ යෙදවීම සේවයේ නියුක්ත කර ගැනීම, සහ සේවයෙන් පහ කිරීම.

ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරෙන් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර කවර ආකාරයක හෝ සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීමේ, ඉටු කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන හත් දෙනකුට නොවැඩි පස් දෙනකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත වූ භාරකාර මණ්ඩලයක් විසින් මෙම පනතේ විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීතිවලට අනුකූලව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී භාරයේ භාරකාර මණ්ඩලයේ ධුර දැරූ තැනැත්තන්ගෙන් සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය සමන්විත විය යුතු ය.

භාරකරුවකු වීමට නුසුදුසුකම්.

**6.** යම් තැනැත්තකු—

(අ) බෞද්ධයකු නොවන්නේ නම් ;

(ආ) වයස අවුරුදු තිහ සම්පූර්ණ කර නොමැති නම් ;

(ඇ) බංකොලොත් හෝ බුන්වත් පුද්ගලයකු බවට අධිකරණයක් මගින් ප්‍රකාශ කරන ලද පුද්ගලයකු වන්නේ නම් ;

(ඈ) සිහිවිකල තැනැත්තකු වන්නේ නම් ; හෝ

(ඉ) දුරාචාරාත්මක වැරැද්දක් කළ බවට නිසි අධිකරණයක් විසින් ප්‍රකාශ කරනු ලැබ ඇති තැනැත්තකු වන්නේ නම්,

ඒ තැනැත්තා භාරකාර මණ්ඩලයේ සාමාජිකයකුවීමට සුදුස්සෙකු නොවන්නේ ය.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාවේ යම් රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සියල්ල ම හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් බඳවා ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් නෙරපීම සහ පුරප්පාඩු පිරවීම ;

(ආ) භාරකාර මණ්ඩලයේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්යය ;

(ඇ) භාරකාර මණ්ඩලයේ රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ එම රැස්වීම්වල ගණපූරණය ; සහ

(ඈ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් (1) වන උපවගන්තියේ දැක්වෙන ආකාරයට සාදනු ලැබූ රීතිවලට එවැනි ම රැස්වීමක දී, එවැනි ම ආකාරයෙන් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලුම භාරකරුවන්, නිලධරයන් සහ සේවකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු හෝ සංස්ථාවට අයවිය යුතු ණය.

**8.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී භාරයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ ණය සහ බැරකම් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට භාරයට අයවිය යුතු සියලු ණය සහ ගෙවිය යුතු දායක මුදල් සංස්ථාවට අයවිය යුතු ණය සංස්ථාවට ගෙවිය යුතු දායක මුදල් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට—

(අ) මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ම වූ දිනයේ දී භාරයේ බැරට පැවති සියලු මුදල්වලින් ; සහ

(ආ) ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල් සහ ප්‍රදාන ලෙස සංස්ථාව වෙත ලැබුණු සියලු මුදල්වලින්,

සමන්විත අරමුදලක් තිබිය යුතු ය.

(2) අරමුදලේ බැරට ඇති සියලු මුදල් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීමේ දී සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ දී භාරකාර මණ්ඩලය විසින් දරන ලද වියදම් පියවීම සඳහා යොදවනු ලැබිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ

සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවට චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**11.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය සහ ශක්‍යතාව ඇති අතර, ඒ සියලු දේපළ මේ පනතේ කාර්යය සඳහා 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාව විසින් දැරිය යුතු ය. සංස්ථාවේ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට හැකි මුළු බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ මුද්‍රාව.

**12.** සංස්ථාවේ මුද්‍රාව භාරකාර මණ්ඩලයේ ඕනෑම සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**13.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

**14.** ජනරජයේ හෝ රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.